Prepared by- ඩී.එච්.ඩබ්.පී.කපුගෙදර

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/

**2.1.1 සිලින්ඩරාකාර බඳුනක දැමූ හබරල පැළෑටියක් රේඛාවෙන් අඳිමු.**

දයාබර දුවේ, පුතේ,මෙම අභ්‍යාසය සඳහා පහත සඳහන් ද්‍රව්‍ය සපයාගත යුතුය.

1.අඟල් 8ක් පමණ උස ඇති සිලින්ඩරාකාර බඳුනක්

2.පත්‍ර 3ක් ඇති කුඩා හබරළ පැළෑටියක්

3.ද්‍රව්‍ය තැබීමට ධාරකයක්/ලෑල්ලක්

4.2B/4B/6B/8B/10B වැනි පැන්සල් වලින් එකක්

5.සුදු ඩ්‍රෝයිං කඩදාසියක්

6.චිත්‍ර ඇඳීමේ වෙනත් ආධාරක ( අවශ්‍ය පරිදි )

- පළමුව සිලින්ඩරාකාර බඳුන තුළ හබරළ පැළෑටිය රඳවා ගන්න.
- දෙවනුව ඔබේ පාසලේ ඇති ඩෙක්ස් එකක උසැති මේසයක් හෝ ටීපෝ එකක් මත එය තබන්න.
- තෙවනුව ඔබ ඊට 2m පමණ දුරක වාඩිවී සිට හොඳින් නිරීක්ෂණය කර රේඛාමය අභ්‍යාසයක් සේ බලා අඳින්න.
- අදාල ද්‍රව්‍යයන්ගේ ගුණාත්මක ලක්ෂණ මතුවන සේ එළිය - අඳුර යොදමින් ( රේඛාව භාවිතා කර ) නිමා කරන්න.



ඉහත උදාහරණයට අනුව ඔබ රේඛාව හැසිරවිය යුත්තේ එහි විවිධාකාර වූ ස්වභාවයන් ස්මතු වන පරිදියි.ඒ අනුව ඉතා සිහින් රේඛාව ලබා ගැනීමට ඔබට කඩදාසිය මත යොදන තෙරපුම/ පීඩනය අවම කිරීමෙනුත් තද ස්වභාවයන් සහිත රේඛාවක් යෙදීමෙන් අඳුරු වර්ණවත් ඝන රේඛා භාවිතයත් මනා ලෙස සංකලනය කළ යුතුය.අදාල ද්‍රව්‍යයන්හි ත්‍රිමාණ ස්වරූප ලබා ගැනීමේ දක්ෂතාවය මත ලකුණු ලබා ගැනීම තීරණය වනු ඇත.